100/19,Welikadawatta Road
Rajagiriya, Sri Lanka
Tel: 0094 60 2084735
Fax: 0094 11 2866224
Email: corruptionsl.watch@gmail.com
100/19, වැලිකඩවත්ත පාර
රාජගිරිය, ශ්‍රී ලංකාව
දුරකථන: 0094 602084735
ෆැක්ස්: 0094 11 2866224

# දූෂණ විමසුම
# ஊழல் கண்காணிப்பு
# Corruption Watch

## ප්‍රවෘත්ති ප්‍රකාශණය

## කොළඹ පිහිටි රජයේ ඉඩමක් වර්ග අඩිය ශත 18 ට බදු දෙමින් කේපෝර්ට් ව්‍යාපෘතිය හොර පාරෙන් යළි කරලියට

වැට් බදු වංචාවේ ප්‍රධාන වගඋත්තරකරු වූ කාමිල් කුතුප්ඩීන් විසින් ආරම්භ කිරීමට උත්සාහ ගෙන වරාය සේවක විරෝධය නිසා යටපත්ව තිබූ 'කේපෝර්ට්' ව්‍යාපෘතිය සඳහා වෙළෙඳ හා පාරිභෝගික අමාත්‍යශය විසින් කොළඹ පිහිටි රජයේ ඉඩමක් වර්ග අඩිය ශත 18 බැගින් බදු දී ඇති බව 'දූෂණ විමසුම' සංවිධානය වෙත වාර්තා වේ.

ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් ලෙස යළි ආරම්භ කිරීමට නියමිත මෙම ව්‍යාපෘතිය සඳහා, වෙළෙඳ අමාත්‍යංශයට අයත් ඔරුගොඩවත්තේ පිහිටි ආහාර දෙපාර්තමේන්තුවේ චාමස් ධාන්‍යාගාරය පිහිටි ඉඩමෙන් අක්කර 10.1 ක ප්‍රමාණයක් කිසිදු ටෙන්ඩර් කැඳවීමකින් තොරව වසර 10 ක කාලයකට කොළඹ 03, ගාලු පාරේ, 15 වන පටුමගේ, අංක 09 දරන ස්ථානයේ පිහිටා ඇති 'රැන්ක් කන්ටේනර් ටර්මිනල්ස් පුද්ගලික සමාගමට' බදු දී තිබේ.

මේ යටතේ අදාළ ඉඩමේ ගොඩනැගිලි රහිත භූමිය වර්ග අඩියක් ශත 18 ක් තරම් අඩු මුදලකට බදු දී ඇති අතර, එහි ගොඩනැගිලි බදු දී ඇත්තේ ද සාමාන්‍ය වෙළෙඳ පොළ මිලට වඩා බෙහෙවින් අඩු මුදලකට ය. අදාළ බදුදීම්වල දී සාමාන්‍ය පිළිගත් ටෙන්ඩර් පටිපාටිය අනුව රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරුවක් ලබා ගත යුතු වුව ද, මෙහි දී එවැනි කිසිදු තක්සේරුවක් ලබා නොගැනීම විශේෂ කරුණකි.

එසේ ම, මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් තොරතුරු හෙළි වූ වහාම අදාළ පාර්ශ්ව විසින් පෙර දිනයක් යොදා ගිවිසුමට අත්සන් තැබූ බවට ද තොරතුරු හෙළි වී ඇති අතර, අදාළ ගිවිසුමේ සඳහන් වන්නේ එය වෙළෙඳ හා පාරිභෝගික හා සමූපකාර අමාත්‍යංශ ලේකම්වරයා අමාත්‍යංශය වෙනුවෙන් අත්සන් තබන බව වුවත්, ඊට අත්සන් තබා ඇත්තේ, වැඩ බලන ලේකම්වරයකු විසිනි.

එසේ ම, රැන්ක් කන්ටේනර් සමාගමේ ලිපිනය ලෙස ගිවිසුමේ සඳහන් කර ඇති ලිපිනයේ පවත්වා ගෙන යනු ලබන්නේ, එක්තරා කැසිනෝ ව්‍යාපාරයක් වීම ද මෙහි දී කැපී පෙනේ.

මෙවැනි ගිවිසුමක් අත්සන් කිරීමේ දී ඊට අඩුම තරමින් ප්‍රධාන පෙළේ රජයේ නිලධාරීන් දෙදෙනකුවත් අත්සන් තැබිය යුතු වුවත්, මීට අත්සන් තබා ඇත්තේ එක් නිලධාරියකු පමණි.

එම තත්ත්වය තුළ, කොළොන්නාව නගර සභාව මෙම ඉඩමේ අනවසර ඉදිකිරීම් සිදු කිරීමට එරෙහිව කොළඹ 07, ග්‍රෙගරි පාරේ, අංක 14/1 හි පදිංචි රවී විජේරත්න නමැති පුද්ගලයා වෙත 2009 ජනවාරි 27 වැනි දා කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා ඇත.

ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් ලෙස යෝජනා කරනු ලැබුවත්, මෙම ව්‍යාපෘතිය සඳහා කිසිදු ආයෝජනයක් සිදු කොට නැති අතර, එහි ඇත්තේ සිංගප්පූරුවේ වසර 25 කට අධික කාලයක් පාවිච්චි කොට ඉවත දමනු ලැබූ දොඹකර කිහිපයක් පමණි.

2002 ජූනි 21 වැනි දා කුඩා පරිමාන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස කරලියට ආ මෙම යෝජනාවලියේ ප්‍රධානි කාමිල් කුතුප්ඩීන් වට් බදු වංචාවට හසුව රටින් පැන යාම නිසා තාවකාලිකව යටපත් වී තිබිණ.

මෙම 'කේපෝර්ට්' ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු බහලු නිශ්කාෂණය හා නිදහස් කිරීමේ කටයුතු පෞද්ගලික අංශයට පැවැරේ. මෙම තත්ත්වය තුළ ගුදම් ගාස්තු හා ප්‍රමාද ගාස්තු අය කර ගැනීමේ හැකියාව ශ්‍රී ලංකා වරාය අධිකාරියට අහිමි වනු ඇත. තව ද, සේවක අතිරික්තයක් පවතින වරාය අධිකාරිය තුළ සේවක අර්බුදය තව තවත් වර්ධනය විය හැකි බව වරාය වෘත්තීය සමිති ප්‍රකාශ කරයි.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුවහොත්, ශ්‍රී ලංකා වරාය අධිකාරියට වාර්ෂිකව මිලියන 10,000 කට වැඩි අලාභයක් සිදු වන බවට ප්‍රකාශ කරමින්, වරාය වෘත්තීය සමිති මීට ඉහත දී මෙම ව්‍යාපෘතියට එරෙහිව දැඩි උද්ඝෝෂණයක් ක්‍රියාත්මක කළ අතර, මේ පිළිබඳව මේ වන විටත් ජනාධිපතිවරයා වෙත ලිඛිතව දැනුම් දී ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුව ප්‍රමාණවත් ඉඩ කඩ තිබිය දී මෙසේ පුද්ගලික අංශයට අදාල කටයුතු පැවරීම තුළින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට මෙන් ම, රජයට අතිවිශාල ආදායමක් අහිමි වී යාමත්, එම ලාභය කෙලින් ම, පුද්ගලික ව්‍යාපාරිකයින් සතු වීමත්, එසේ ම, වත්මන් ලෝක ආර්ථික තත්ත්වය හමුවේ නැව් ගමනා ගමනයේ සිදු වන අඩුවීම් හමුවේ අර්බුදයට ලක්වෙමින් ඇති වරාය අධිකාරිය තව දුරටත් ආදායම් අඩු වීම හමුවේ සේවක වැටුප් පවා ගෙවා ගත නොහැකිවීමේ අවධානම පිළිබඳව වරාය වෘත්තීය සමිති විසින් ජනාධිපතිවරයා වෙත දැනුම් දී තිබේ.

රට තුළ පවතින ආරක්ෂක තත්ත්වය හමුවේ කන්ටේනර් බහලුම් නිශ්කාෂණ කටයුතු පුහුණු සේවකයින් හෝ ස්කෑනර් යන්ත්‍ර පවා නොමැති පෞද්ගලික ආයතනවලට පැවැරීම හොර ජාවාරම්වලට අනුබලදීමක් වන බව ද එම වෘත්තීය සමිති අනතුරු අඟවා සිටී.

ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් ලෙස ඉදිරිපත් කර ඇතත්, මෙම ව්‍යාපෘතිය සඳහා මේ දක්වා නිසි ආකාරයෙන් කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබී නොමැත. මේ සඳහා 2008 අප්‍රේල් 23 දින කැබිනට් මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද බවට ඊට අදාළ ගිවිසුමෙ හි සඳහන් කර ඇතත්, අදාළ කැබිනට් මණ්ඩල පත්‍රිකාවෙ හි අඩංගු කරුණු කිසිවක් හෝ කොන්දේසි කිසිවක් එම ගිවිසුමට ඇතුළත් කොට නොමැත.

**ශිරාල් ලක්තිලක,**
**මාධ්‍ය ප්‍රකාශක - දූෂණ විමසුම**

**2009. 02. 18**